Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 31 March 2016

# ශ්‍රී ලාංකීය පාරිභෝගිකයින්ගේ වැඩිම මනාපයෙන් මැගී 'වසරේ ආහාර සන්නාමය' සම්මානයෙන් සිව්වැනි වරටත් පිදුම් ලබයි

නෙස්ලේ සමාගමේ සුවිශේෂ නිෂ්පාදනයක් වන මැගී, 2016 ස්ලිම් (SLIM) - නීල්සන් ජනතා සම්මාන උළෙලේදී 'වසරේ ආහාර සන්නාමය' සම්මානය සඳහා ශ්‍රී ලාංකික පාරිභෝගික ප්‍රජාවේ වැඩිම මනාපය නැවත වරක් හිමිකර ගැනීමට සමත්විය. මෙවර ජනතා සම්මානයෙන් මැගී පිදුම්ලැබූයේ පිළිවෙලින් සිව්වෙනි වරටය. මැගී සන්නාමයේ ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය පිළිබඳව පාරිභෝගික ජනතාව තබා ඇති ඉහළම විශ්වාසය මෙම සම්මානය හරහා මැනවින් පැහැදිලි වේ.

''අපගේ පාරිභෝගිකයන් විසින් පිළිවෙලින් සිව් වැනි වරටත් 'වසරේ ආහාර සන්නාමය' සම්මානය අප වෙත ලබා දීම පිළිබඳව අපි ඉතාමත් සතුටට පත්වන අතර එය අප වෙත ලබා දුන් සුවිසල් ගෞරවයක් ලෙස සලකනවා. ශ්‍රී ලංකාවේ සෑම ගෘහයකම විශ්වාසය දිනූ සන්නාමයක් බවට මැගී පත්ව සිටින්නේ වසර 30ක පමණ කාලයක සිටයි. සන්නාමයක් වශයෙන් පාරිභෝගිකයාට ඉහළ ප්‍රමිතියකින් යුතු නිෂ්පාදනයක් ලබාදීමේ ඉලක්කගත අරමුණකින් යුක්තව, පසුගිය දශක තුනකට වැඩි කාලයක් තුළ අපගේ පාරිභෝගිකයින්ගේ වෙනස්වන අවශ්‍යතා පිළිබඳව නිසි අවබෝධයෙන් කටයුතු කිරීම නිසා මෙවන් ජයග්‍රහණයකට මග පෑදුණු බව අප සිතනවා. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආහාර සන්නාමයක් වශයෙන් මැගී වෙත ලබා දුන් මේ ඇගයීම සම්බන්ධයෙන් අපගේ හිතවත් පාරිභෝගිකයින් වෙත හෘදයාංගම ස්තුතිය සහ ප්‍රණාමය පුදකර සිටිනවා.'' යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය උප සභාපති - ආහාර, ප්‍රියදර්ශිනී කරුණාරත්න මහත්මිය මෙම සුවිශේෂ අවස්ථාව පිළිබඳ තම අදහස දක්වා සිටියාය.

මුළුතැන්ගෙය තුළ ශ්‍රී ලාංකික ගෘහණියන් සවිබලගැන්වීම සඳහා හැකියාව ඇති සන්නාම කිහිපයෙන් එකක් වන මැගී, පුළුල් පරාසයක නිපැයුම් පෙළක් සහිතය. ශ්‍රී ලංකාවේ වැවෙන උසස් තත්ත්වයේ නැවුම් පොල් යොදාගෙන නිපදවන 'මැගී පිටිකළ පොල් කිරි' මේවන විට ශ්‍රී ලාංකික ගෘහණියන්ගේ අංක එකේ තේරීම බවට පත්ව ඇති අතර මුළුතැන්ගෙයි අත්‍යවශ්‍ය ඉවුම් පිහුම් ආධාරකයක්වී තිබේ. 1980 දශකයේ අගභාගයේ ශ්‍රී ලාංකික වෙළෙඳපොලට හඳුන්වා දුන් අවස්ථාවේ සිට ඉවුම් පිහුම් කලාවේ විප්ලවීය වෙනසක් සිදුකරීමට මැගී පිටිකළ පොල් කිරි සමත් විය. පොල් ගෑම සහ පොල් මිරිකීම වැනි ආයාසයකින් තොරව ඉතාමත් සරළ ලෙස ජලයට පිටිකළ පොල් කිරි එකතුකරගනිමින් තම ව්‍යාංජන රසවත් කරගැනීමට මැගී පිටි කළ පොල් කිරි නිසා අවස්ථාව ලැබී තිබේ. මැගී පිටි කළ පොල් කිරි නිසා ඉවුම් පිහුම් සඳහා වැයවන කාලය ඉතිරිවනවා පමණක් නොව ව්‍යාංජන සඳහා නැවුම් පොල් රසයම ලබා ගැනීමට හැකියාව ලැබේ.

ශ්‍රී ලාංකික සම්ප්‍රදායික ව්‍යාංජන බොහෝ ප්‍රමාණයක් රසවත් කරගැනීම සඳහා 'මැගී රස මුසු' යොදගැනීම බහුලවම සිදු වේ. ශ්‍රී ලාංකික මුළුතැන්ගෙවල්වල පිසින ව්‍යාංජන සහ සම්බෝල රසවත් කරගැනීම සඳහා යොදා ගන්නා ලූණු, සුදුලූණු සහ තෝරාගත් දේශීය කුළුබඩු වර්ග කිහිපයකම සැබෑ රසය මැගී රස මුසු මගින් ලැබේ.

ස්වභාවිකත්වය කෙරෙහි නවීන පාරිභෝගිකයාගේ ඇති කැමැත්ත අනුව කටයුතු කරමින් පෝෂණය, සෞඛ්‍ය සහ යහගුණය වෙනුවෙන් නෙස්ලේ මව් සමාගම දක්වන කැපවීම බෙදා හදා ගැනීමට නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි. ඒ අනුව යමින් තම නිපැයුම් පෙළෙහි පෝෂණ අගය ක්‍රමානුකූලව ඉහළ නැංවීමට මැගී කටයුතු කරයි. මැගී චිකන් නූඩ්ල්ස් සහ මැගී කරි නූඩ්ල්ස් යන මැගී ක්ලැසික් නූඩ්ල්ස් පෙළ කැල්සියම් සහ විටමින් A පෝෂණයෙන් සවිබල ගන්වා ඇති අතර මැගී රස මුසු සඳහා යකඩ පෝෂක යොදාගනිමින් නිර්දේශිත ආහාර අවශ්‍යතාවයෙහි අන්තර්ගත විය යුතු මෙම ක්ෂුද්‍ර පෝෂකයන් 1/3 ක් ලබාදීමට කටයුතු කර තිබේ. මැගී චිකන් සහ මැගී කරි නූඩ්ල්ස් සඳහා සැබෑ එළවළු සහ කුළු බඩු වැනි අමුද්‍රව්‍ය යොදාගනිමින් රසවත්බව මෙන්ම යහගුණය ලබාදීමට කටයුතු කිරීම මැගී නිපැයුම් පෙළට එක් කළ නවතම පෝෂණ නව්‍යකරණය වේ. මැගී චිකන් සහ මැගී කරි නූඩ්ල්ස් සඳහා කහ, සාදික්කා, සූදුරු සහ කරඳමුංගු වැනි ශ්‍රී ලාංකික මුළුතැන්ගෙවල්හි යොදාගන්නා ජනප්‍රිය 'ගෘහ අමුද්‍රව්‍යයන්'යොදාගනිමින් තවදුරටත් පෝෂණ අගය ඉහළ නංවා ඇත.

නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මේ පිළිබඳව අදහස් දක්වමින් ''මේ ජයග්‍රහණයෙන් අපගේ නිෂ්පාදනයන්හි විශිෂ්ට ප්‍රමිතිය මෙන්ම අපගේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා මැනවින් අවබෝධකරගැනීම සඳහා අප සතු ශක්තිය තහවුරු කරයි. එපමණක් නොවෙයි ශ්‍රී ලාංකික ජනතාව මැගී නිෂ්පාදන කෙරෙහි තබා ඇති නිරන්තර විශ්වාසය පෙන්නුම්කරන අවස්ථාවක් ලෙසද මා මෙය හඳුන්වන්නට කැමතියි.'' යනුවෙන් පැවසුවාය.

ස්ලිම් (SLIM) - නීල්සන් ජනතා සම්මාන උළෙල ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අලෙවිකරණ සම්මාන උළෙලකි. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සහ නීල්සන් සමීක්ෂණ නියෝජිතායතනය ඒකාබද්ධව සංවිධානය කරන මෙම උළෙල ශ්‍රී ලංකාවේ ජන හදවත් මැනවින් ස්පර්ෂ කරන ලද සන්නාම සහ පුද්ගල චරිත ඇගයීමට ලක්කෙරෙන විශිෂ්ටතම අවස්ථාවක් ලෙස ඉහළ පිළිගැනීමක් දිනාගැනීමට සමත්වී සිටී.